

# “අහරට පැළයක්”

කුසගිනි නැති ජාතියක්..

## ජාතික රුක් රෝපණ වැඩසටහන

ස්වාධීන රූපවාහිනී ITN Sri Lanka

PLANET PROTECTORS

මෙරට තුළ දේශීය පළතුරු රැකගනිමින්

ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම

සඳහා සහ ඒ ඔස්සේ මතු පරපුරේ ආහාර

සුරක්ෂිත කිරීමේ අරමුණින්

ස්වාධීන රූපවාහිනී සේවය සහ

**PLANET PROTECTORS**

එක්ව සිදුකරන සමාජ සත්කාරයකි.



# හැඳින්වීම සහ පසුබිම



**PLANET PROTECTORS** යනු වඳවීගෙන යන ශාක, පස සහ සාගර පද්ධති සංරක්ෂණය කිරීම උදෙසා මෙයට වසර තුනකට පෙර ආරම්භ කරන ලද, පරිසර හිතකාමී තරුණ ශ්‍රමයකින් සැදුම්ලත් සංවිධානයකි. අපගේ ප්‍රධානතම ඉලක්කය වනුයේ "පැළ මිලියනයක්" සංකල්පය යටතේ වඳවීයාමේ තර්ජනයට ලක්ව ඇති දේශීය ශාක විශේෂ මිලියනයක් දිවයින පුරා රෝපණය කිරීමයි. ගතවූ වසර 3 ක කෙටි කාලය තුළදී පමණක් ශාක 19,000 කට ආසන්න ප්‍රමාණයක් සාර්ථකව රෝපණය කිරීමට අප සංවිධානය සමත්ව ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සහ ප්‍රමුඛතම රාජ්‍ය මාධ්‍ය ජාලයක් වන ස්වාධීන රූපවාහිනී සේවය සමඟ අත්වැල් බැඳගනිමින්, ලාංකීය ජන සමාජයෙන් සහ පරිසරයෙන් ක්‍රමයෙන් වඳවී යන දේශීය පළතුරු ශාක සංරක්ෂණය කිරීම උදෙසා "අහරට පැළයක්" නමින් නව දීප ව්‍යාප්ත ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අප බලාපොරොත්තු වෙමු.

# ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු



## දේශීය පළතුරු සංරක්ෂණය:

අප සතුව තිබූ වටිනා සහ ගුණාත්මක දේශීය පළතුරු වර්ග මතු පරපුර වෙනුවෙන් වඳවී යා නොදී රැකගැනීම.

## ජෛව විවිධත්වය සුරැකීම:

දේශීය ශාක ප්‍රජාව වර්ධනය කිරීම මඟින් මෙරට පක්ෂි සහ සත්ව ගහනයට අවශ්‍ය ආහාර සහ වාසස්ථාන සපයා ජෛව විවිධත්වය සුරක්ෂිත කිරීම.



## අනාගත ආහාර සුරක්ෂිතතාව:

දේශගුණික විපර්යාස හමුවේ වුවද ඔරොත්තු දෙන, පෝෂ්‍ය ගුණයෙන් ඉහළ දේශීය පළතුරු බහුල කිරීම මඟින් රටේ අනාගත ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම.





## නාගරික හරිතකරණය:

සීඝ්‍රයෙන් නාගරීකරණය වන ප්‍රදේශ හඳුනාගෙන, ඒවා නැවත හරිතවත් කලාප බවට පත් කිරීම.

## ගෝලීය උෂ්ණත්වය සහ දේශගුණික විපර්යාසයන්ට විසඳුම් සෙවීම

ලෝක ව්‍යාප්ත ගැටලුවක් වී ඇති ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම පාලනය කිරීම, වායුගෝලීය කාබන් ප්‍රතිශතය අවම කිරීම සහ දේශගුණික විපර්යාසයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා දේශීය පරිසර පද්ධතිය ශක්තිමත් කිරීම.



"අහරට පැළයක්"
කුසගිනි නැති ජාතියක්..

# ව්‍යාපෘති මූලාරම්භය
## (ජුනි 05 වන දින - ITN පරිශ්‍රයේදී)



මෙම සුවිශේෂී ජාතික ව්‍යාපෘතියේ මූලාරම්භක පියවර ස්වාධීන රූපවාහිනී ආයතනයේ සංවත්සරය යෙදෙන ජුනි මස 05 වන දින ආයතන පරිශ්‍රයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.එදිනට අප රට තුළ බහුලව තිබූ නමුත් වර්තමානයේ දුර්ලභ වෙමින් පවතින පහත සඳහන් දේශීය පළතුරු ශාක වර්ගවලින් පැළ 100 ක් ෂඹහ පරිශ්‍රය තුළ රෝපණය කෙරේ.

මෙම පරිශ්‍රය මෙම ශාක රෝපණය කර ආරක්ෂිතව නඩත්තු කිරීම සඳහා ඉතාමත් සුදුසු, ඉඩකඩ සහිත මෙන්ම ආරක්ෂිත පරිසරයකි. එමෙන්ම, ප්‍රධාන මාධ්‍ය ආයතනයක් වෙත විවිධ වැඩසටහන් සඳහා පැමිණෙන කුඩා දරුවන් ඇතුළු මහජනතාවට මෙම දුර්ලභ දේශීය ශාක සජීවීව දැකබලා ගැනීමටත්, ඒවා පිළිබඳව අධ්‍යාපනික අවබෝධයක් ලබාගැනීමටත් මෙයින් සුවිශේෂී අවස්ථාවක් සැලසේ.

**හිඹුටු, ලාවලු, වීර, පලු, මොර, කීන, කෝන්, ලෝලු, දං, මසං, කටකෑල, හීන් ඇඹිල්ල, මොනර පෙතන්, ඇඹිල්ල, කරඹ, වෙරළු, කොස්, බෙලි, නමිනං, ජමනාරං, උගුරැස්ස, ලොවි ගඩුගුඩා, බිලිං සහ ඇටඹ (දේශීය අඹ වර්ග)**

"අහරට පැළයක්"
කුසගිනි නැති ජාතියක්..

# දීප ව්‍යාප්ත මහා ව්‍යාපෘතියේ දිගුකාලීන සැලසුම



ජුනි 05 වන දින  ඇරඹෙන මෙම ව්‍යාපෘතිය එතැනින් නොනැවතී, ස්වාධීන රූපවාහිනී සේවයේ මාධ්‍ය අනුග්‍රහය සහ ප්‍රචාරණ දායකත්වය ඇතිව දිවයින පුරා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ.

- දිස්ත්‍රික් මට්ටමින් ව්‍යාප්ත කිරීම: දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පාසල්, රාජ්‍ය ආයතන, විහාරස්ථාන සහ පොදු ස්ථාන කේන්ද්‍ර කරගනිමින් දේශීය පළතුරු පැළ සිටුවීමේ මහා සංග්‍රාමයක් දියත් කිරීම.

- ප්‍රජා සහභාගීත්වය: "අහරට පැළයක්" සංකල්පය ජනගත කරමින්, සෑම නිවසකම අවම වශයෙන් එක් දේශීය පළතුරු පැළයක්වත් සිටුවීමට මහජනතාව දිරිමත් කිරීම.

- සුරැකීමේ සහ අධීක්ෂණ ක්‍රියාවලිය: PLANET PROTECTORS සංවිධානය මඟින් සිටුවන සෑම පැළයකම වර්ධනය නිරීක්ෂණය කිරීම සඳහා තාක්ෂණික හෝ ප්‍රජා මට්ටමේ නඩත්තු වැඩපිළිවෙළක් සකස් කිරීම.

# ජාතික වශයෙන් මෙහි ඇති අනාගත වැදගත්කම



කුසගිනි නැති ජාතියක්" යන්න හුදෙක් උද්‍ඝෝෂණ පාඨයක් පමණක් නොවේ. එය අනාගත ශ්‍රී ලංකාව උදෙසා දකින ජාතික සිහිනයකි. මෙම ව්‍යාපෘතිය හරහා රටට ලැබෙන දිගුකාලීන ප්‍රතිලාභ මෙසේය:

- ආර්ථික ස්වෛරීභාවය: දේශීය පළතුරු පරිභෝජනය ඉහළ යාම තුළින් විදේශීය පළතුරු ආනයනය සඳහා වැයවන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රට තුළ ඉතිරි කරගත හැක.

- පෝෂ්‍යදායී සෞඛ්‍ය සම්පන්න පරපුරක්: රසායනික ද්‍රව්‍යවලින් තොර, ස්වාභාවික දේශීය පළතුරු මඟින් අනාගත පරපුර ලෙඩ රෝගවලින් වැළකී, පෝෂණයෙන් සපිරි සෞඛ්‍ය සම්පන්න සමාජයක් බිහිවීමට මඟ පෑදේ.

- දේශගුණික විපර්යාසයන්ට මුහුණ දීම: දේශීය ශාක මෙරට පසට හා දේශගුණයට මැනවින් අනුවර්තනය වී ඇති බැවින්, දැඩි නියඟයන් හෝ දේශගුණික විපර්යාස හමුවේ වුවද ආහාර සුරක්ෂිතතාව බිඳ වැටීමට නොදී රැකගැනීමට මේවා සමත් වේ.

- මාධ්‍ය සහ සිවිල් සමාජයීය සබැඳියාව: රාජ්‍ය මාධ්‍ය ජාලයක් සහ ස්වේච්ඡා සංවිධානයක් එක්ව සිදුකරන මෙම සත්කාර්යය, රටේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා සිවිල් සමාජය සහ මාධ්‍ය එකට අත්වැල් බැඳගන්නා ආකාරය පිළිබඳව කදිම ජාතික ආදර්ශයක් වනු ඇත.

"අහරට පැළයක්"
කුසගිනි නැති ජාතියක්..

"අහරට පැළයක්" ව්‍යාපෘතිය යනු හුදෙක් තවත් එක් රුක් රෝපණ වැඩසටහනක් නොව, රටේ අනාගතය, පරිසරය සහ මිනිස් ජීවිත සුරක්ෂිත කරන ජාතික මෙහෙවරකි.

ස්වාධීන රූපවාහිනී සේවයේ අභිමානවත් සංවත්සර දිනයේදී, මෙම අති උදාර වැඩසටහනේ සමාරම්භක පියවර සඳහා නිල සහයෝගීතාවය ලබාදෙන ලෙසත්, මෙම ජාතික මෙහෙවරේ ප්‍රධාන සන්නිවේදන සහකරු ලෙස කටයුතු කරමින් රටම හරිතවත් කිරීමට දායක වන ලෙසත් **PLANET PROTECTORS** සංවිධානය වෙනුවෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

# "අහරට පැළයක්"

කුසගිනි නැති ජාතියක්..

**ජාතික රුක් රෝපණ වැඩසටහන**

